ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 81 | S | I |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2008 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2008 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, Augñt 2008

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**வணிகக் கல்வியும் கணக்கீடும் I**
**Business and Accounting Studies I**

පැය එකයි
*One hour*

සැලකිය යුතුය :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දි ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරුදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසදෙන කවය මත (**x**) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දි ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

---

01. අවශ්‍යතා හා වුවමනා අතර ප්‍රධාන වෙනස දැක්වෙන ප්‍රකාශනය තෝරන්න.
   i. අවශ්‍යතා පොදු අතර වුවමනා අත්‍යවශ්‍ය වේ.
   ii. අවශ්‍යතා ද්විතියික වන අතර වුවමනා ප්‍රාථමික වේ.
   iii. අවශ්‍යතා පොදුවන අතර වුවමනා විවිධ වේ.
   iv. අවශ්‍යතා පොදු වන අතර වුවමනා සීමිත වේ.

02. ව්‍යාපාර ආයතනයක් සඳහා පිළිගත හැකි පොදු නිර්වචනයක් වන්නේ,
   i මානව අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන්නා වු ඕනෑම කටයුත්තක් ව්‍යාපාරයකි.
   ii. මුදල් පදනම මත භාණ්ඩ හා සේවා අලෙවි කරන ආයතන ව්‍යාපාරයකි.
   iii. කර්මාන්ත හා උපකාරක සේවා වල එකතුව ව්‍යාපාරයකි.
   iv. ගනුදෙනුකරුවන් හා විකුණුම්කරුවන් හමුවන ඕනෑම ස්ථානයක් ව්‍යාපාරයකි.

03. ව්‍යාපාර ඓතිහාසික වර්ධනයේ ප්‍රධාන අදියරයන් පිළිවෙලින් දැක්වෙන්නේ,
   i. ස්වයං පෝෂිත ආර්ථිකය, පුද්ගල විශේෂීකරණය, භාණ්ඩ හුවමාරුව, කාර්මික විප්ලවය, මුදල් භාවිතය, තොරතුරු තාක්‍ෂණය.
   ii. ස්වයං පෝෂිත ආර්ථිකය, පුද්ගල විශේෂීකරණය, භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, කාර්මික විප්ලවය, තොරතුරු තාක්‍ෂණය.
   iii. ස්වයං පෝෂිත ආර්ථිකය, භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, පුද්ගල විශේෂීකරණය, කාර්මික විප්ලවය, තොරතුරු තාක්‍ෂණය.
   iv. ඉහත ආකාරයේ නිවැරදි පිළිතුරක් දැක්විය නොහැක.

04. වෙළෙඳ පොළ ක්‍රමය (Market System) දැකිය හැකි ලක්‍ෂණයක් වන්නේ,
   i. අලෙවියෙන් පසු සේවාව   ii. ප්‍රචාරණ කටයුතු
   iii. අවසාන පරිභෝජනය   iv. ඉහත කිසිවක් නොවේ.

05. හොඳ මුදලක ලක්‍ෂණයක් වන්නේ,
   i. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම   ii. වටිනාකම රැස්කිරීමේ මාධ්‍යයක් වීම
   iii. සාපේක්‍ෂ වශයෙන් හිඟ ද්‍රව්‍යයක් වීම   iv. ඉහත සියල්ලම.

06 මුල්‍ය කල්බදු ක්‍රමය හා මෙහෙයුම් කල්බදු ක්‍රමය අතර ඇති ප්‍රධාන වෙනසක් වන්නේ,
   i. මුල්‍ය කල්බදු ක්‍රමයේ ගිවිසුම දිගුකාලීන වේ.
   ii. මෙහෙයුම් කල්බදු ක්‍රමය තුළදී වත්කම් නඩත්තුව බදුකරු සිදු කිරීම.
   iii. මුල්‍ය කල්බදු ක්‍රමයේ ගිවිසුම් කොන්දේසි දැඩිව තිබීම.
   iv. මෙහෙයුම් කල්බදු ක්‍රමයේ ගිවිසුම අවලංගු කිරීමට දෙපාර්ශවයේම එකඟතාවය අවශ්‍ය වේ.

07. ප්‍රධානියාගේ භාණ්ඩ වල අයිතිය හා වගකීම තමා වෙත භාරගෙන භාණ්ඩ අළෙවි කර කොමිස් මුදලක් ලබා ගනී. මෙම ලක්‍ෂණ ඇති නියෝජිත තොග වෙළෙන්දා වනුයේ,

i. කැපකරු නියෝජිත තොග වෙළෙන්දා
ii. සාධ්‍යක නියෝජිත තොග වෙළෙන්දා
iii. කොමිස් නියෝජිත තොග වෙළෙන්දා
iv. වණික් තොග වෙළෙන්දා

08. තොග වෙලෙන්දාගේ ප්‍රධාන කාර්යයක් වන්නේ,

i. නිෂ්පාදකයාට මූල්‍ය පහසුකම් සැපයීම.
ii. නව භාණ්ඩ හඳුන්වා දීම
iii. භාණ්ඩ වල තත්වය හා පාවිච්චිය පිළිබඳ උපදෙස් දීම.
iv. විවිධ වර්ණයන්ගෙන් අවශ්‍ය වේලාවට භාණ්ඩ සැපයීම.

09. කමල් ඇමරිකාවේ ජීවත් වන ස්ටීවන්ගෙන් රු. 100,000 වටිනා චොකලට් තොගයක් ආනයනය කරන ලදි. මෙම භාණ්ඩ තොගය 2008.03.30 වන දින කොළඹ වරායට ලගා වන ලදි. කමල් විසින් මෙම භාණ්ඩ තමාගේ භාණ්ඩ බව ඔප්පු කිරීමට රේගු නිලධාරියාට ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලියවිල්ල වන්නේ,

i. තීරු බදු හා ගුදම් ගාස්තු ගෙවූ රිසිට්පත
ii. ඉන්ඩෙන්ටුව
iii. ණයවර ලිපිය
iv. නෞභාරපත

10. ව්‍යාපාර ආයතනයක බාහිර ව්‍යාපාර පරිසරයක් වන ආර්ථික පරිසරය තුළ දැකිය හැකි ලක්‍ෂණ වන්නේ,

i. ජාතික නිෂ්පාදනය, මිල මට්ටම
ii. ජාතික නිෂ්පාදනය, ජීවන වියදම
iii. වැටුප් මට්ටම, විදේශ විනිමය අනුපාත
iv. ඉහත සියල්ලම.

11. සමුපකාර ව්‍යාපාරය ගොඩනැගී ඇති මූලධර්ම අතරින් එහි මූල ධර්මයක් නොවන්නේ,

i. සමානාත්මතාවය ii. සමාජවාදය iii. ප්‍රජාතන්ත්‍රවාදය iv. සාධාරණත්වය

12. 2007 අංක 07 දරණ නව සමාගම් පනතට අනුව සමාගම් බාහිර සම්බන්ධතාවය දැක්වීම සඳහා අනුබද්ධ කර ඇති ලියවිල්ල වන්නේ,

i. ලියාපදිංචි කිරීමේ අයදුම්පත
ii, සාංගමික සංස්ථාපත්‍රය
iii. සාංගමික ව්‍යවස්ථාවලිය
iv. ව්‍යවස්ථාපිත ප්‍රකාශය

13. කුලිපිට ගැණුම් ක්‍රමය මගින් භාණ්ඩ ගැනීමේ දී සිදුවන වාසියක් නොවන්නේ,

i. සුළු මුදල් ප්‍රමාණයක් ගෙවා භාණ්ඩ ගැනීමට හැකි වීම.
ii. මුදල් ගෙවන අතරතුරම භාණ්ඩය පාවිච්චි කිරීමට හැකි වීම.
iii. ගෙවීම අවසාන වන විට විශාල මුදලක් ගෙවා තිබීම.
iv. පොළිය හා මුද්දර ගාස්තු යනාදිය දරීමට සිදුවීම.

14. ආනයනය කරන ලද භාණ්ඩ කිසිදු වෙනසකට භාජනය නොකර නවත් රටකට අපනයනය කිරීම.

i. ආනනයන හා අපනයන වෙලෙදාම යනුවෙනි.
ii. ද්විපාර්ශවීය වෙළෙදාම යනුවෙනි.
iii. අන්තරාල වෙලෙදාම
iv. ප්‍රතිඅපනයන වෙළෙදාම යනුවෙනි.

15.. ශ්‍රී ලංකා රක්‍ෂණ ඇකඩමිය මගින් සිදුකරනු ලබන කාර්යයකි.

i. ජීවිත රක්‍ෂණ කටයුතු පමණක් සිදු කිරීම.
ii. රථ වාහන රක්‍ෂණ කටයුතු පමණක් කිරීම.
iii. රක්‍ෂණ සේවය හා සම්බන්ධ පුහුණු කටයුතු කිරීම.
iv. ජීවිත හා උවදුරු රක්‍ෂණ කටයුතු කිරීම.

16. නිෂ්පාදකයකුට තම නිෂ්පාදනයේ ගුණාත්මක බව ඉහල මට්ටමක ඇති බව පෙන්නුම් කිරීමට යොදා ගත හැකි කාර්යයකි.

i. ඉහළ මිලක් නියම කිරීම.
ii. SLS ලාංජන ලබා ගැනීම.
iii. ප්‍රචාරණ කටයුතු කිරීම
iv. ඉහල වර්ගයේ ඇසුරුම් ද්‍රව්‍ය භාවිත කිරීම.

17. දත්ත සන්නිවේදනය අයත් කාර්යයක් නොවන්නේ,

i. දත්ත එක්රැස් කිරීම ii. දත්ත සකස් කිරීම iii. දත්ත සම්ප්‍රේෂණය කිරීම. iv. දත්ත භාවිතය.

18. කොටස් වෙළෙඳ පොළේ පවතින ගිණුමකි.

i. ජංගම ගිණුම
ii. ඉතිරිකිරීමේ ගිණුම
iii. මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම
iv. ස්ථාවර තැන්පතු ගිණුම.

19. භාණ්ඩාගාර බිල්පතක් භාණ්ඩාගාර බැදුම්කරයකින් වෙනස් වන්නේ,
   i. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කිරීම.
   ii. ප්‍රාථමික වෙළෙදුන් විසින් ප්‍රථම අලෙවිය සිදු කිරීම.
   iii. සුරක්ෂිත ආයෝජන මාර්ගයක් විම.
   iv. කල් පිරෙන කාලය වර්ෂයකට අඩු විම.

20. පාරිභෝගිකයන් ආරක්ෂා කිරිමේ පනත ක්‍රියාත්මක කිරිමේ වගකිම පැවරී ඇත්තේ
   i. ප්‍රමිති කාර්යාංශයට.
   ii. අභ්‍යන්තර වෙළෙදාම පිළිබඳ කොමසාරිස් දෙපාර්තමේන්තුව.
   iii. විනිමය පාලන දෙපාර්තමේන්තුවට
   iv. වාණිජ දෙපාර්තමේන්තුවට.

21. බිමල් විසින් සමන්ගෙන් භාණ්ඩ තොගයක් ගෙන සති දෙකක් ඇතුළත් චෙක්පතක් නිකුත් කර ගෙවීම් කරන ලදි. නමුත් පසුව සමහර අයිතම පලුදු වි ඇති බව හදුනා ගත් බිමල් ඒවා නැවත වරක් සමන් වෙත යවන ලදි. මෙම ගනුදෙනු බිමල්ගේ මුලික සටහන් පොත් වල වර්තා කිරිමට අදාල ප්‍රභව ලියවිලි වන්නේ,
   i. ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය හා බැරපත
   ii. ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, හරපත
   iii. ඉන්වොයිසිය, පිළිපත හා හරපත
   iv. භාණ්ඩ ලැබීමේ තුණ්ඩුව, පිළිපත හා බැර තුන්ඩුව

22. ආපසු එවුම් ජ'නලය සකස් කිරීම සඳහා යොදා ගනු ලබන මුලික ලියවිල්ල වන්නේ,
   i. වවුචරය ii. හරපත iii. විකුණුම් ඉන්වොයිසිය. iv. බැරපත

23. නිකුත් කර ඇති චෙක්පතක් අඟරු විමට අදාළ ද්විත්ව සටහන
   i. අගරු වු චෙක් ගිණුම හර, බැංකු ගිණුම බැර
   ii. මුදල් තීරුව බැර, ණය හිමි ගිණුම හර
   iii. මුදල් තීරුව හර, ණයගැති ගිණුම බැර
   iv. බැංකු තීරුව හර, ණය හිමි ගිණුම බැර

24. එක්තරා වෙළෙන්දෙක් ගත්මිලට 10% ක් ලාභ තබා, භාණ්ඩයක් රු. 5,500 කට විකුණනු ලබයි. එම භාණ්ඩය ගත් මිල වන්නේ,
   i. රු. 5500 ii. රු. 5000 iii. රු. 5750 iv. රු. 6500

25. නිවැරදි ගිණුම්කරණ සමිකරණය වනුයේ,
   i. ප්‍රාග්ධනය - වියදම් - වත්කම් =- (ආදායම් + වගකීම්)
   ii. ප්‍රාග්ධනය - වියදම් - වත්කම් =- (ආදායම් - වගකීම්)
   iii. ස්ථාවර වත්කම් + ජංගම වත්කම් - ආයෝජන වත්කම් =හිමිකම් + දිගුකාලින වගකීම් + ආදායම් - වියදම්)
   iv. ප්‍රාග්ධනය + වියදම් - වත්කම් =+ (ආදායම් + වගකීම්)

26. ආපසු එවුම් සටහන් කිරිමේ ද්විත්ව සටහන වනුයේ,
   i. ආපසු එවුම් ගිණුම හර, ණය හිමියෝ බැර
   ii. ආපසු එවුම් බැර, ණයගැතියෝ හර
   iii. ණයහිමියෝ බැර, ආපසු එවුම් හර
   iv. ණයගැතියෝ බැර, ආපසු එවුම් හර

27. පොදු ජ'නලයේ සටහන් කළ යුතු ගනුදෙනුවකි.
   i. ආපසු එවන ලද භාණ්ඩ.
   ii. විකිණීම සඳහා ණයට ගත් භාණ්ඩ.
   iii. කාර්යාල ප්‍රයෝජනය සඳහා ණයට ගත් ලි බඩු
   iv. ආපසු යවන ලද භාණ්ඩ.

28. ගිණුම්කරණයේ මුලික අරමුණ වන්නේ,
   i. සියලුම ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරිම.
   ii. මුල්‍ය ගනුදෙනු සටහන් කිරිම.
   iii. තොරතුරු භාවිත කරන පාර්ශවයන්ට තිරණ ගැනිම සඳහා තොරතුරු සැපයිම.
   iv. ඉහත කිසිවක් නොවේ.

29. උපාලි තම මාසික ආදායමින් කිසියම් මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ වාණිජ බැංකුවක තැන්පත් කරයි. එම තැන්පත් කිරීමේ දී බැංකුකරු අවුරුද්දක් සඳහා 10% ක පොළි ප්‍රතිශතයක් ලබා දීමට පොරොන්දු වුණි. වර්ෂය අවසානයේ රු. 11,000 ක ගිණුම් ශේෂය ඔහුගේ ගිණුමේ දක්නට ලැබුණි. එබැවින් 10% ක පොළි ප්‍රතිශතයක් මත වර්ෂය අවසානයේ ලැබිමට අපේක්ෂිත රු. 11,000 ක ලබා ගැනිමට ආයෝජනය කල මුදල කියද?
   i. රු. 9090.00 ii. රු. 10,000.00 iii. රු. 12,100.00 iv. රු. 12,222.00

30. ජංගම ගිණුම් හිමියකුට බැංකුවෙන් සැලසෙන සේවා කිහිපයක් පහත දැක්වේ. ඊට අයත් නොවන සේවාව තෝරන්න.

i. චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුව ii. ගනුදෙනුකරුගේ ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

iii. තැන්පතු සඳහා පොලියක් ගෙවීම. iv. බැංකු අයිරා පහසුකම් ලබා දීම.

31. ස්ථාවර වත්කම් ණයට ගැනීම පිළිබඳ ජ'නල් සටහන,

i. ණයට ගැනුම් ගිණුම හර, ගැනුම් ගිණුම බැර ii. ණයහිමි ගිණුම බැර, ස්ථාවර වත්කම් ගිණුම හර

iii. වත්කම් ගිණුම බැර, ණයගැති ගිණුම හර iv. ස්ථාවර වත්කම් ගිණුම හර, ණයහිමි ගිණුම බැර

32. මුදල් පොතේ ද්විත්ව කාර්යයක් වනුයේ,

i. උපයෝගි පොතක් ලෙස හා අවසාන ගිණුමක් ලෙස කටයුතු කිරීම.

ii. ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම හා උපයෝගි පොතක් ලෙස කටයුතු කිරීම.

iii. ප්‍රති සටහන් සටහන් කිරීමට හැකි වීම.

iv. සිහිවටන තිරු පවත්වා ගෙන යාම හා උපයෝගි පොතක් ලෙස කටයුතු කිරීම

33. මුදල් පොතේ බැංකු ශේෂයත්, බැංකු ප්‍රකාශණයේ ශේෂයත් අසමාන වීමට බලපෑ හේතුවක් නොවන්නේ,

i. නිශ්කාශණය නොවූ චෙක්. ii. නිකුත් කළ මුත් උපලබ්ධි නොවූ චෙක්

iii. බැංකුව මගින් සිදුවිය හැකි වැරදි iv. ණයගැති ප්‍රේශණ සටහන් වීම.

34. තොගයක නිෂ්පාදන පිරිවැය රු. 40,000 කි. ලාභ ආන්තිකය 20% කි. නිෂ්පාදන ඒකක සංඛ්‍යාව 2000 කි. එක් භාණ්ඩ ඒකකයක විකුණුම් මිල වනුයේ,

i. 20 ii. 28 iii. 40 iv. 24

35. පහත දැක්වෙන වැරදි වලින් ශේෂ පිරික්සුම මගින් හඳුනාගත හැකි වන්නේ,

i. ගැණුම් රු. 500 ක් ගිණුම් පොත් වලින් මග හැරීම.

ii. රක්ෂණ ගාස්තු වශයෙන් ගෙවූ රු. 1000 වැටුප් ගිණුමේ සටහන් වීම.

iii. විදුලිය ගාස්තු ගිණුමේ ශේෂය වූ රු. 1000 ශේෂ පිරික්සුමට පිටපත් නොකිරීම.

iv. මිලට ගත් ලිබඩු රු. 3,000 ගැනුම් ගිණුමේ සටහන් කිරීම.

36. ආයතනයක ගිණුම්කරණ තොරතුරු සංඛ්‍යාත්මකව පමණක් නිවැරදි බව පෙන්වන්නේ,

i. ශේෂ පත්‍රය මගිනි ii. ශේෂ පිරික්සුම මගිනි iii. පොදු ජ'නලය මගිනි iv. ලාභ අලාභ ගිණුම මගිනි

37. මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තිරුවේ එකතුව හා එක් එක් ණය ගැතියාට අදාළ වට්ටම් ප්‍රමාණය සටහන් කළ යුත්තේ,

i. දුන් වට්ටම් ගිණුම හර අදාල ණය ගැති ගිණුම බැර

ii. ණයගැති ගිණුම හර දුන් වට්ටම් ගිණුම බැර

iii. දුන් වට්ටම් ගිණුම හර ණයහිමි ගිණුම බැර

iv. දුන් වට්ටම් ගිණුම බැර ණයහිමි ගිණුම බැර.

38. ව්‍යාපාරයක් එහි ප්‍රයෝජනය සඳහා ණයට ගත් යන්ත්‍රෝපකරණ මුලින්ම සටහන් කල යුත්තේ,

i. ගැණුම් ජ'නලයේය. ii. පොදු ජ'නලයේ ය. iii. ගැනුම් ගිණුමේ ය. iv. මුදල් පොතේ ය.

39. ප්‍රධාන මුදල් භාරකරුගෙන් සුළු මුදල් භාරකරු වෙත දෙන සුළු මුදල් අග්‍රිමය සටහන් කරන ද්විත්ව සටහන වන්නේ,

i. සුළු වියදම් ගිණුම හර<br>මුදල් පොත බැර

ii. සුළු මුදල් පොත හර<br>මුදල් පොත බැර

iii. මුදල් පොත හර<br>සුළු මුදල් පොත බැර

iv. සුළු වියදම් ගිණුම හර<br>සුළු මුදල් පොත බැර.

40. රථ වාහන අලුත් වැඩියාව සඳහා වැය කළ රු. 1,500 ක් රථවාහන ගිණුමට හර කිරීම

i. ඌනතා දෝෂයකි ii. හිලව් දෝෂයකි iii. අතිරික්ත දෝෂයකි iv. මුලධර්ම දෝෂයකි.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.